# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 දෙසැම්බර්

### සමාජීය විද්‍යා පීඨය

### සංවර්ධන අධ්‍යයන (නව නිර්දේශය)

### ශ්‍රී ලංකාවේ සංවර්ධන වෙනස්වීම් DVST– E 3015

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. යටත් විජිත සමයේදී ශ්‍රී ලංකාවේ සිදුවූ සමාජ-ආර්ථික සංවර්ධනයේ වෙනස්වීම් නිදහසින් පසු සංවර්ධනයට බලපා තිබෙන ආකාරය නිදසුන් මගින් පෙන්වා දෙන්න. (ලකුණු 20)

02. ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය සාර්ථක කරගැනීමට මෙරටේ භූගෝලීය පදනම වටහාගැනීමේ අවශ්‍යතාව අවධාරණය කරන්න. (ලකුණු 20)

03. පසුගිය අඩසියවසක කාලය තුළ දී ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකර්මාන්තයෙහි සිදු වූ වෙනස්කම් 04 ක් සඳහන් කොට, ඒවායේ ප්‍රගතිය විවේචනාත්මකව පෙන්වා දෙන්න. (ලකුණු 20)

04. ශ්‍රී ලංකාවේ වියළි දේශගුණ කලාපයේ ජනාවාස ව්‍යාප්ත කිරීමට මහවැලි සංවර්ධන ව්‍යාපාරය බලපෑ ආකාරය විමර්ශනය කරන්න. (ලකුණු 20)

05. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම සඳහා විවෘත ආර්ථික ප්‍රතිපත්ති යටතේ ක්‍රියාත්මක කල අපනයන සැකසුම් කලාපවල දායකත්වය අගයන්න. (ලකුණු 20)

06. ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින ප්‍රාදේශීය සංවර්ධන විෂමතා මොනවාදැයි කෙටියෙන් දක්වා ඒ කෙරෙහි බලපානු ලැබූ රාජ්‍ය ප්‍රතිපත්ති සහ වැඩසටහන් උදාහරණ ඇසුරෙන් ගෙනහැර දක්වන්න. (ලකුණු 20)

07. ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයක් ඇතිවීමට බලපානු ලැබූ සංවර්ධන හා පරිපාලන දුර්වලතා හතරක් (04) සාකච්ඡා කරන්න. (ලකුණු 20)

08. ශ්‍රී ලංකාවට තිරසර සංවර්ධනයක් අත්කරගැනීමට මෙරට සංවර්ධන සැලසුම්වල සිදුකල යුතු පරිවර්තන සහේතුකව යෝජනා කරන්න. (ලකුණු 20)

***********************************